## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### වෙබ් ලේඛක MN 2-2025 (කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහුකාර්ය ඛණ්ඩ 1 සේවා ගණය සඳහා) බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඉහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ද සමග **2026 අප්‍රේල් මස 20** දින හෝ ඊට පෙර ලැබෙන සේ, **රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තමන් අයදුම්කරන තනතුර කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම www.governmentinformation.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය.)

**වෙබ් ලේඛක තනතුර - පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 06 (සිංහල මාධ්‍ය 1, දෙමළ මාධ්‍ය 2, ඉංග්‍රීසි මාධ්‍ය 03)**

1. **වැටුප් පරිමාණය** - 2025.03.25 දිනැති අංක 10/2025 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 02-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය

   රු.48,470-10×540-11×630-10×1,010-10×1,190-රු.82,800/-

   ක් වන අතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ . එම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි ඔබගේ පත්වීම් දින සිට වැටුප් ගෙවනු ලැබේ.

2. **වයස් සීමාව -** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

3. **අධ්‍යාපන සුදුසුකම් -** සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක වරක දී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;

   *සහ*

   අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම.

4. **වෘත්තීය සුදුසුකම් -** තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් අනුමත ආයතන විසින් පිරිනමනු

   ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබීම.

5. **පළපුරුද්ද - අදාළ නොවේ.**

6. **කායික සුදුසුකම්** - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක ම සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7. **බඳවා ගැනීමේ ක්‍රමය** - ලිඛිත විභාගය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගිනි. (සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)

8. **විභාග පරිපාටිය** - රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද ආයතනයක් මඟින් විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන් ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| සමාජ මාධ්‍ය හා පුවත්පත් කලාව | පැය 01 | 100 | 40 |
| භාෂා හැකියාව හා පුවත්පත් කලාව | පැය 2/1 02 | 100 | 40 |

විභාගය සඳහා වන විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| සමාජ මාධ්‍ය හා පුවත්පත් කලාව | ප්‍රවෘත්ති රචනය<br>සෘජු මාර්ගගත ප්‍රවෘත්ති රචනය<br>වෙබ් අඩවි තුළ ප්‍රවෘත්ති පළ කිරීම<br>සමාජ මාධ්‍ය හා සන්නිවේදන තාක්ෂණික උපක්‍රම<br>පුවත්පත් සාකච්ඡා හා ප්‍රවෘත්ති ගොනු කිරීම<br>ඡායාරූප හා වෙබ් අඩවි සන්නිවේදනය |
| භාෂා හැකියාව හා පුවත්පත් කලාව | පුවත්පත් භාෂාව<br>ප්‍රවෘත්තිකරණය<br>භාෂාව හා සිරස්තල<br>භාෂාව හා ඡායාරූප<br>විශේෂාංගකරණ හා වාර්තා භාෂාව<br>නිර්මාණාත්මක භාෂාව |

9. **සේවා නියමයන් හා කොන්දේසි -**

   I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

   II. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුලත බඳවාගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

   III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුෂාංගික සඳහන් විධි විධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

   IV. අංක 2310/29 දරන 2022.12.14 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුවේ අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

   V. ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ නොදෙන අතර ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

10. **තනතුරට අදාළ කාර්යයන් -**

    I. පාර්ලිමේන්තුව/ අමාත්‍යාංශ/රජයේ ආයතන/ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මාධ්‍ය ආවරණවලට සහභාගී වීම හා දෛනික ප්‍රවෘත්ති සකස් කර ඉදිරිපත් කිරීම.

    II. රජයේ පුවත් රජයේ නිල වෙබ් අඩවියට (සිංහල/ දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයෙන්) ඇතුළත් කිරීම.

    III. අධ්‍යක්ෂ (විශේෂ මාධ්‍ය ඒකකය) සහ වෙබ් සංස්කාරක විසින් පවරන ලද රාජකාරී ඉටු කිරීම.

    IV. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් විසින් පවරනු ලබන වෙනත් රාජකාරී ඉටු කිරීම.

11. අයදුම්කරුවන් විසින් සහතිකවල සහතික කළ පිටපත් (මුල් පිටපත නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය

    යුතු අතර ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

    I. උප්පැන්න සහතිකය;
    II. අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලිපි;
    III. වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන ලිපි.

12. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

13. අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

14. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන (දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ, ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

15. **අත්සන සහතික කිරීම -** දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවෙකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතු ය. එනම් සමාදාන විනිශ්වයකාරවරයෙකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, වාර්ෂිකව රු.782,808/-ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍යය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන කෙනෙකු විය යුතු ය.

16. විභාග කොන්දේසි

    I. විභාග ගාස්තුව රු.1000/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී **රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ නමින් මහජන බැංකුවේ නාරාහේන්පිට ශාඛාවේ 119100109026220 ගිණුම් අංකය** වෙත බැර කර, එහි රිසිට්පත අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ අමුණා එවිය යුතු ය.

    II. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ආයතනයක් මගින් ලිඛිත විභාගය 2026 මැයි මාසයේ දී කොළඹ දී පවත්වනු ලැබේ.